www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාන්ඩුව වාර්ගික ගැටුමට ව්‍යාජ විසඳුමක් යෝජනා කරයි

## Sri Lankan government proposes phony solution to communal conflict

**කේ. රත්නායක විසිනි**
**2008 පෙබරවාරි 15**

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ රටේ පවතින "ජනවාර්ගික ගැටලුවට" "දේශපාලනික විසඳුමක්" වශයෙන් ජනවාරි 23 වන දා තවත් යෝජනාවක් ප්‍රකාශයට පත් කලේ ය. රාජපක්ෂ දිවයිනේ දෙමල සුලුතරයට එරෙහිව ක්‍රමානුකූලව වෙනස්කම් කිරීම අවසානයකට ගෙන ඒම සඳහාත් රට තුල පවතින 25 වසරක කුරිරු යුද්ධය අවසන් කිරීම සඳහාත් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග සාකච්ඡා කරන්නට සැලසුමක් ඉදිරිපත් කරමින් සිටින්නේ යැයි විශ්වාසය තැබීම සම්බන්ධයෙන්, කොලඹ දේශපාලනික සංකේත පද මාලා අර්ථකථනය කරන්නට නොපුරුදු ඕනෑ ම කෙනෙකුට, සමාව ලැබෙනු ඇත. මේ කිසිවක් සත්‍යය නො වේ.

එල්ටීටීඊය සමග සාකච්ඡා කිරීමේ අදහසක් තමන්ට නැති බව රාජපක්ෂ යලි යලිත් පැහැදිලි කොට තිබේ. ජනවාරි මුල දී ඔහුගේ ආන්ඩුව, තමන් නාමිකව පමනක් පිලිපදිමින් සිටි 2002 සටන් විරාමයෙන් නිල වශයෙන් ඉවත් විය. පසු ගිය 18 මසක කාලය තුල දී, මිලිටරිය නැගෙනහිර පිහිටා තිබූ සියලු ප්‍රධාන එල්ටීටීඊ බල කඳවුරු අල්ලා ගෙන ඇති අතර, උතුරේ පිහිටි එල්ටීටීඊ බල කඳවුරුවලට එරෙහි මෙහෙයුම් ආරම්භ කොට තිබේ. ජනාධිපති සිය "දේශපාලන විසඳුම" නිවේදනය කරද්දීත් හමුදාව සටන උග්‍ර කරමින් සිටියේ ය.

රාජපක්ෂගේ නිවේදනයේ අරමුණ වන්නේ යුද්ධය අවසන් කිරීම නො ව, එල්ටීටීඊය මිලිටරිමය වශයෙන් විනාශ කිරීමේ ආන්ඩුවේ සැලසුම වසන් කිරීම සඳහා ව්‍යාජ ආවරනයක් සැපයීම යි. වසරකටත් වැඩි කාලයක් තිස්සේ, එල්ටීටීඊ හිතවාදී දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) හැර, පාර්ලිමේන්තුව තුල සිටින ආන්ඩුවේ සහ විරුද්ධ පක්ෂයේ සියලු පක්ෂ ඇතුලත් වන සර්ව පාක්ෂික නියෝජිත කමිටුව (ඒපීආර්සී) තුල ඇති වූ දිග් ගැසුනු කලහයේ ප්‍රතිඵලය වී ඇත්තේ මෙම නිවේදනයයි. ඒපීආර්සීය පිහිටුවන ලද්දේ 2006 ජුලි මාසයේ මිලිටරිය මාවිල්ආරු ප්‍රදේශයට සිය පලමු නැගෙනහිරදිග ආක්‍රමනය දියත් කරන්නට යන්තම් පෙර සමයක ය යන කරුන මෙහි ලා අර්ථභාරී වෙයි.

"දේශපාලන විසඳුමේ" අන්තර්ගතය එහි අරමුන වඩාත් පැහැදිලි කරයි. රාජපක්ෂයේ මෙහෙයවීම මත, ඒපීආර්සීය තුල නියෝජිත දේශපාලන පක්ෂ කඩිනමින් යෝජනාව සූදානම් කලේ ය. එය ඉදිරිපත් කොට ඇත්තේ, දෙමල ජනයාගෙන් බහුතරය ජීවත් වන උතුරට සහ නැගෙනහිරට "උපරිම සහ ඵලදායී බලය බෙදා හැරීමක්" සිදු කරන්නට බලය ලැබෙන පරිදි දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය "සම්පූර්නයෙන් ක්‍රියාත්මක කරන්නට" ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් වන "ක්‍රියාකාරී සැලැස්මක්" වශයෙනි.

ඇත්ත වශයෙන් ම, ඒපීආර්සී සැලසුමෙන් නියෝජනය වන්නේ 1987 දී යුද්ධය අවසන් කිරීම සඳහා දැරූ පලමු අසාර්ථක ප්‍රයත්නය වෙත, එනම් ඉන්දු-ලංකා ගිවිසුම වෙත පාර්ශ්වීය වශයෙන් ආපසු යාමකි. ඉන්දියානු අගමැති රජීව් ගාන්ධි සහ ශ්‍රී ලංකා ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන විසින් අත්සන් තබන ලද එම ගිවිසුම යටතේ "දෙමල නිජබිමක්" සඳහා කෙරෙන ඉල්ලීම්වලට අනුග්‍රහ දැක්වීමක් වශයෙන් උතුරු සහ නැගෙනහිර පලාත් දෙක ඒකාබද්ධ කෙරුනි. දහතුන් වන සංශෝධනය මගින් පලාත් මට්ටමට සීමිත ආකාරයක ස්වාධීනත්වයක් ද පවරා දෙනු ලැබුනි. ගිවිසුම බල ගැන්වීම සඳහාත් එල්ටීටීඊ ගරිල්ලා සටන්කරුවන් නිරායුධ කිරීම සඳහාත් ඉන්දියානු "සාමසාධක" හමුදා උතුරට සහ නැගෙනහිරට යවන ලදි.

1988 සැප්තැම්බරයේ දී පලාත් සභා මැතිවරන පවත්වනු ලැබුනි. එහෙත්, ගිවිසුම ජාතිය පාවා දීමක් යැයි හෙලා දකිමින් ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) විසින් ගෙන යන ලද වාර්ගික උද්ඝෝෂනයේ ප්‍රතිඵලයක් වශයෙන් ආන්ඩුව උතුරු-නැගෙනහිර පලාත් සභාව විසුරුවා හැරියේ ය. රාජපක්ෂ දැන් දහතුන් වන සංශෝධනය ක්‍රියාත්මක කරන්නට කැඳවුම් කරන මුත් ඔහු සිටියේ ජවිපෙ උද්ඝෝෂනයට සහාය දුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (ශ්‍රීලනිප) නායකයන් අතර යි. පසු ගිය 20 වසර පුරා, ඒකාබද්ධ කරන ලද උතුරු සහ නැගෙනහිර පලාත් පැවතී ඇත්තේ මිලිටරි පාලනයක් යටතේ ය. ඉන්දියානු "සාමසාධකයන්" සහ එල්ටීටීඊ සටන්කරුවන් අතර සටන් පුපුරා යාමත් සමග ගිවිසුමමත් ඉක්මනින් ම බිඳ වැටුනි.

මැත ම සැලැසුම උතුර සහ නැගෙනහිර ඒකාබද්ධ කිරීමේ යෝජනාවට ආපසු යාමක් නො වේ. ජවිපෙ සහ ජාතික හෙළ උරුමය (ජාහෙඋ) විසින් ආරම්භකත්වය ගන්නා ලදුව, දහතුන් වන සංශෝධනය උල්ලංඝනය කරමින්, ශ්‍රේෂ්ඨාධිකරනය පසු ගිය වසරේ උතුරු සහ නැගෙනහිර පලාත් වෙන් කරන්නට නියෝග කලේ ය. රාජපක්ෂ ආන්ඩුව ජවිපෙ-ජාහෙඋ ක්‍රියාවට එරෙහිව ප්‍රශ්නයක් මතු කලේ වත් උසාවියේ තීන්දුවට විරුද්ධත්වය පෑවේ වත් නැත. දැන් නැගෙනහිර පලාත් සභා මැතිවරන ලගා වෙමින් තිබේ.

එහෙත්, මැත ම "දේශපාලන විසඳුම", පවත්නා පලාත් සභා ඉරා දමමින් සහ වඩා කුඩා දිස්ත්‍රික්ක සභා පිහිටුවමින් වඩාත් සීමිත මට්ටමක බලය බෙදා හැරීමක් උදෙසා ශ්‍රීලනිපය පසු ගිය මැයි මාසයේ ඉදිරිපත් කල යෝජනාවෙන් තරමක ආ පස්සට යාමකි. 1981 දී, එනම් 1983 දී යුද්ධය පුපුරා යන්නට පෙර සමයේ ජනාධිපති ජයවර්ධන දිස්ත්‍රික්ක සභා පලමුව හඳුන්වා දුන් විට එවක පැවති දෙමල දේශපාලන පක්ෂ විසින් එය මුලුමනින් ම ප්‍රතික්ෂේප කෙරුනි.

ශ්‍රීලනිපයේ දිස්ත්‍රික්ක සභා යෝජනාව සැලසුම් කරන ලද්දේ රාජපක්ෂගේ පාලක සන්ධානයේ හවුල්කරුවන් වන ජවිපෙට සහ ජාහෙඋට ආයාචනය කරන්නට යි. සිංහල බෞද්ධ ප්‍රභූන්ගේ දේශපාලනික අධිපති භාවයට වල කැපෙන මොන යම් ආකාරයක අනුග්‍රහයක් වුව දෙමල සුලුතරයට ලබා දීම ගැන පාර්ශ්වයන් දෙක ම බලගතු ලෙස සතුරු ය. "ඒකීය රාජ්‍යය" ආරක්ෂා කිරීමේ නාමයෙන් ඔවුහු, ආන්ඩුවේ බලතල ප්‍රාදේශීය මට්ටමට බෙදා හරින මොන යම් හෝ අතිශය සීමිත විසඳුමකට පවා විරුද්ධ වෙති.

කෙසේ වුව ද, යෝජනාවෙන් කියැවෙන ආකාරයට, දහතුන් වන සංශෝධනය "සම්පූර්නයෙන් ක්‍රියාත්මක කිරීම" නිවේදනය කරන්නට රාජපක්ෂ ගත් තීන්දුවට දෙමල කතා කරන ජනයාගේ, විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පලාත්වල දෙමල කතා කරන ජනයාගේ ප්‍රාර්ථනාවන් ඉටු කිරීම සමග මෙලොව සම්බන්ධයක් නැත. එය සැලසුම් කරනු ලබන්නේ, ශ්‍රී ලංකාව තුල පැන නැග ඇති විවෘත යුද්ධය සම්බන්ධයෙන් මහ බලවතුන් අතර පවතින සාංකාවටත් යුද්ධය සහ ඉන් ඇති වන ආර්ථික බලපෑම සම්බන්ධයෙන් වැඩෙන අව්‍යාජ මහජන විරුද්ධත්වයටත් ආමන්ත්‍රනය කිරීමට ය.

මෙම පියවර වනාහි එල්ටීටීඊයට එරෙහිව යලි ඇරඹූ යුද්ධයට නිහඬව සහාය දෙන ඉන්දියානු ආන්ඩුවට සුවිශේෂයෙන් ආමන්ත්‍රනය කිරීමකි. ශ්‍රී ලාංකික දෙමල ජනයා පීඩාවට පත් කරන අසාධාරනකම්වලට එරෙහිව පුලුල්ව පැතිර ගිය නොමනාපයක් ඇති දකුනුදිග තමිල් නාඩු ප්‍රාන්ත රාජ්‍යය තුල පවතින විරුද්ධත්වයට ඉන්දියානු ආන්ඩුව මුහුන දෙයි. දෙමල විරෝධී වෙනස්කම් කිරීම් ආමන්ත්‍රනය කිරීමට "දේශපාලනික පැකේජයක්" සැලසුම් කරන ලෙස නව දිල්ලිය ශ්‍රී ලංකාන්ඩුවට යලි යලිත් කැඳවුම් කර තිබේ. ඒපීආර්සී සැලසුම නිවේදනය කිරීමෙන් අනතුරුව, ඉන්දියාවේ විදේශ කටයුතු පිලිබඳ ඇමති එය "ඉත සිතින් පිලිගත හැකි පලමු පියවරක්" ලෙස වග වර්නනා කලේ ය.

එල්ටීටීඊය දේශපාලනිකව හුදෙකලා කරන්නට සහ අනෙක් දෙමල පක්ෂවල සහාය එක්රැස් කර ගන්නට ද රාජපක්ෂ උත්සාහ කරයි. සන්ධානයේ හවුල්කරුවෙකු වන ඊලම් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (ඊපීඩීපී) නියෝජිතයන්ට සහ තමන් සමග ගැලතී සිටින නට්ටං වූ දෙමල එක්සත් විමුක්ති පෙරමුනේ නායක වී. ආනන්දසංගරීට පැකේජය පිලිබඳව සාකච්ඡා කිරීම සඳහා රැස්වීමකට එන ලෙස ඔහු ආරාධනා කලේ ය. යෝජනාවට සහාය දුන්නේ ඊපීඩීපීය පමනි.

ආන්ඩුවට සහාය දෙන ආනන්දසංගරී, සැලසුම යුක්ති සහගත නැතැයි කියමින් රාජපක්ෂ ඉදිරියේ විවෘතව ම එය විවේචනයට ලක් කලේ ය. පසුව ආනන්දසංගරී මාධ්‍යවලට කියා සිටියේ, යෝජනාවලට එකඟ වීමෙන් ආන්ඩුවේ රබර් මුද්‍රාවක් බවට පත් වන්නට තමන්ට නොහැකි බව යි. බොහෝ දෙමල ජනයා බරපතල පාවාදෙන්නෙක් ලෙස දැනටමත් දැක ගන්නා ආනන්දසංගරී සිටින්නේ 1987 අසාර්ථක් විසුම දුර්වල කිරීමක් නියෝජනය කරන සැලසුමකට සහාය දිය හැකි තත්ත්වයක නො වේ. ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය (ශ්‍රීලංමුකො) සහ දෙමල ජනයා මත පදනම් වන බස්නාහිර පලාත් මහජන පෙරමුන (ඩබ්ලිව්පීඑෆ්) ද ආන්ඩුවේ යෝජනාවලින් ඈත් වී සිටින අතර, වඩා පුලුල් බලය බෙදා හැරීමේ පැකේජයක් ඉල්ලා සිටිති.

පලාත් ආන්ඩුකාරයා ප්‍රධානත්වය දරන උපදේශක මන්ඩලයක් උතුරු පලාතට පත් කරන්නට තමන්ට ඇති අභිප්‍රාය රාජපක්ෂ නිවේදනය කොට තිබේ. එමෙන් ම, ආන්ඩුවට සහ රාජ්‍ය ආයතන වෙත ප්‍රවේශ වීම සඳහා දෙමල ජනයාට හැකියාව ගෙන දීමට දෙමල කතා කරන පොලිස් නිලධාරීන් සහ වෙනත් කාර්ය මාන්ඩලිකයන් බඳවා ගන්නට ද පැකේජයෙන් කටයුතු සම්පාදනය කෙරේ. එහෙත් පැකේජයේ සීමිත සහ කල් පමා වූ ස්වභාවය මගින් අවධාරනය කෙරෙන්නේ, රටේ දෙමල සුලුතරයට එරෙහිව දිගු කලක් තිස්සේ සිදු වන නිල වෙනස්කම් කිරීම්වල පවතින බරපතලකම යි.

යෝජනාවලට "වාම" මුහුනුවරක් ගෙන දීම සඳහා ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප) සේවය කැඳවනු ලැබ තිබේ. දශක හතරකට වැඩි කලකට ඉහත දී ශ්‍රීලනිප ආන්ඩුවට එක් වීම මගින් ට්‍රොට්ස්කිවාදී මූලධර්ම පාවා දුන් ලසසපය, ශ්‍රීලනිපයෙන් මත් වෙන් කොට දැක්විය නොහැකි වන නිලධාරිවාදී හිස් කටුවක් බවට පිරිහී ගොස් තිබේ. එසේ තිබිය දීත්, "සාමය සඳහා වැඩ

කිරීමක්" ලෙස ඒපීආර්සීය වෙස් ගන්වන්නට ලසසපයේ එක ම මන්ත්‍රී වන තිස්ස විතාරන එහි සභාපතිවරයා ලෙස තෝරා පත් කෙරුනි.

ආන්ඩුවේ පක්ෂ තමන්ගේ මන්ත්‍රීන්ට ඇම දැමීම ගැන චෝදනා කරමින් එක්සත් ජාතික පක්ෂය (එජාප) 2007 සැප්තැම්බරයේ දී කමිටුවෙන් ඉවත් විය. 20 වසරක් ආ පස්සට යාමක් ලෙස හඳුන්වමින් එජාපය මෑත ම යෝජනාව ප්‍රතික්ෂේප කල මුත්, තමන්ගේ ම වූ කිසි ම සැලසුමක් ඉදිරිපත් කොට ද නැත. 1983 දී යුද්ධය ආරම්භ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු එජාපය, ශ්‍රීලනිපය මෙන් ම සිංහල අධිපතිවාදී දේශපාලන මඩ ගොහොරුවේ එරී සිටියි. මහ ලේකම් තිස්ස අත්තනායක ප්‍රකාශ කලේ, "රට නොබෙදන ඕනෑ ම විසඳුමකට" පක්ෂය සහයෝගය දෙන බව යි. මෙය ජවිපෙ විධානයට දේශපාලනිකව හිස නැමීමකි.

මොන යම් ආකාරයේ හෝ පලාත්වලට බලය බෙදා දීමකට කටුක ලෙස විරුද්ධ වන ජවිපෙ ඒපීආර්සී සාකච්ඡාවට විරුද්ධත්වය පාමින් 2006 දෙසැම්බරයේ දී ඉන් ඉවත් විය. කඩිමුඩියේ පුවත්පත් සාකච්ඡාවක් කැඳවූ ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, යෝජනාවලට එරෙහිව පක්ෂය "සියලු ශක්තිය යොදා" සටන් වදින බව ප්‍රකාශ කලේ ය.

පසුව පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවක දී, මිලිටරිය " එල්ටීටීඊය සමූලොත්පාඨනය කර දැමීම මුල් තැනට එන බව" ප්‍රකාශ කරමින් අමරසිංහ යම් තරමකට පසු බැස්සේ ය. ඒ අතර ම, ජවිපෙ දැනට මත් ප්‍රකෝපකාරී ඉන්දියානු විරෝධී උද්ඝෝෂනයක් අවුලුවා තිබේ. " කොටි කුඩු පට්ටම් කරල දාන එක සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික හමුදාව ලබා ගෙන තියෙන සාර්ථකත්වයට බාධා කරන්න ම දැන් දෙමල සුලුතරයත් එක්ක දේශපාලනිකව බලය බෙදා ගැනීමේ විධිවිධානයක් පිලිගන්න ය කියල ශ්‍රී ලංකාවට බල කරන" එක ගැන ජනවාරි 30 වන දා පැවති ප්‍රසිද්ධ රැස්වීමක දී ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.ඩී. ලාල් කාන්ත ඉන්දියාවට චෝදනා කලේ ය.

මේ අදහස් දැක්වීම් මගින් සිහිපත් කෙරෙන්නේ, 1980 ගනන් අග දී ජවිපෙ නායකයන් ඒකීය රාජ්‍යය ආරක්ෂා කිරීමට එක් වන ලෙස සියලු පක්ෂවලින් ඉල්ලා සිටි සහ ශ්‍රී ලංකාවට කෙරෙන ඉන්දියාවේ "අධිරාජ්‍යවාදී" මැදිහත් වීම හෙලා දුටු සමයේ ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව ජවිපෙ ගෙන ගිය ෆැසිස්ට් උද්ඝෝෂනය යි. ජවිපෙ මැරයෝ සිය උද්ඝෝෂනයට සහාය දීම ප්‍රතික්ෂේප කල සිය ගනනක් විරුද්ධවාදීන්, කම්කරුවන්, වෘත්තීය සමිති නායකයන් සහ බුද්ධිමතුන් ඝාතනය කලහ. විශේෂයෙන් ම යුද ප්‍රයත්නය සඳහා වැඩ කරන ජනතාව තම ජීවිත කැප කල යුතු යැයි තමන් කරන ඉල්ලීමට එරෙහිව වැඩෙන විරුද්ධත්වය මධ්‍යයේ ජවිපෙ එම විධික්‍රම යලි පන උන්වීමට සමත් ය.

සාමය දෙසට තබන පියවරක් වෙනුවට, රාජපක්ෂගේ "දේශපාලන විසඳුම" මගින් නියම වශයෙන් පෙන්නුම් කෙරෙන්නේ කොලඹ සමස්ත දේශපාලන සංස්ථාපිතයේ වාර්ගික දේශපාලනය කොතරම් නම් දරුනු ද යන්න යි. ශ්‍රී ලාංකික මිලිටරිය එල්ටීටීඊය විනාශ කිරීමේ සිය අරමුන මුදුන්පත් කර ගත්ත ද, නො වැලැක්විය හැකි ලෙස වෙනත් ස්වරූපයකින් යලි පුපුරා එනු ඇති, මෙම යුද්ධයට යටින් දිග හැරී පවතින වාර්ගික ගැටුම විසඳන්නට එක ම දේශපාලන පක්ෂයක් වත් නො සමත් ය.

© www.wsws.org